# ගෝලීය
# මානව හිමිකම් ප්‍රතිපත්තිය

THE Coca-Cola COMPANY | Global Human Rights

## මානව හිමිකම් සහ අපේ සමාගම

මානව හිමිකම්වලට ගරු කිරීම Coca-Cola සමාගමේ මූලික සාරධර්මයකි. එය අපගේ සේවකයින්ගේ සබඳතා, සැපයුම්කරුවන්ගේ හා බීම බෝතල් කරන සමාගම්වල අපේක්ෂා, සහ ප්‍රජාවන් සහ අපගේ හවුල්කරුවන් අතර සබඳතා වැඩිදියුණු කරයි. අප එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර හා මානව හිමිකම්වල මාර්ගෝපදේශ මූලධර්ම මුලින්ම යොදුගත් සමාගම්වලින් එකකි, මන්ද එය අපගේ සමාගමේ ආචාර ධර්ම, මෙහෙවර සහ දැක්ම සමඟ සබැඳේ. අපි ගෝලීය සමාගමක් වන අතර, අප බලපෑමක් සිදුකරන ජීවිත වැඩිදියුණු කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

අපගේ මානව හිමිකම් ප්‍රතිපත්තිය අපගේ සාරධර්ම පිළිබිඹු කරන අතර එය අපගේ මානව හිමිකම් ගමනේදී අපගේ මාලිමාව වනු ඇත. Coca-Cola සමාගම, අපට අයත් සම්පත්, අපට බහුතර හිමිකම් ඇති වත්කම් හා අප විසින් කළමනාකරණය කරනු ලබන පහසුකම් සඳහා මෙම ප්‍රතිපත්තිය අදාල වේ. අපගේ බීම බෝතල් කරන සමාගම සහ සැපයුම්කරුවන් අපගේ සැපයුම්කරුවන්ගේ මාර්ගෝපදේශක මූලධර්මවලට අනුකූලව අපගේ මානව හිමිකම් ප්‍රමිතීන්ට ගරු කරනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු.

## අපගේ කැපවීම

අපගේ ව්‍යාපාර මෙහෙයුම් සහ වටිනාකම් දාමය හරහා ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ මූලධර්ම සහ බහුජාතික ව්‍යවසායන් සඳහා OECD මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා අපි කැප වන්නෙමු. මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර පනත් කෙටුම්පත, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූලික සම්මුතීන් සහ ක්‍රියාත්මක වන මූලික ප්‍රතිපත්ති සහ අයිතිවාසිකම් පිළිබඳ ILO ප්‍රකාශනය තුළ අන්තර්ගත ජාත්‍යන්තරව පිළිගත් සියලුම මානව හිමිකම්වලට අපි ගරු කරමු.

සුළුතර ප්‍රජාවන්, කාන්තාවන්, සංක්‍රමණික කම්කරුවන් සහ ළමුන් ඇතුළු අපගේ වඩාත් අවදානමට ලක්විය හැකි පාර්ශවකරුවන් සම්බන්ධව අප සතු ඉහළ වගකීම අපි හඳුනා ගන්නෙමු. අපගේ මෙහෙයුම් සහ වටිනාකම් දාමය හරහා කැපී පෙනෙන මානව හිමිකම් අවදානම් හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් වැළැක්වීම සහ අවම කිරීම සඳහා අපි නිසි කඩිසරකම පවත්වා පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වන්නෙමු. අපි සුදුසු අවස්ථාවලදී පිළියම් සඳහා ප්‍රවේශය ලබා දී සහයෝගයෙන් කටයුතු කරන්නෙමු.

## පහත සඳහන් මූලධර්ම අපගේ ගෝලීය වැඩසටහනේ මූලාරම්භයන් වේ:

### සුරක්ෂිත හා යහපත් සේවාස්ථාන

සේවකයින්ට ආරක්ෂාකාරී සහ යහපත් සේවා ස්ථානයක් ලබාගැනීමට අයිතියක් ඇත. අපගේ මෙහෙයුම් තුළ, අනතුරු, තුවාල, සහ සෞඛ්‍ය අවදානම්වලට නිරාවරණය වීමේ අවදානම අවම කිරීමට අපි කටයුතු කරන්නෙමු. බිය උපදවන හෝ මිත්‍රශීලී නොවන වැඩ පරිසරයක් නිර්මාණය කරන නුසුදුසු වාචික, ශාරීරික, ලිංගික හෝ වෙනත් හැසිරීම් ඇතුළු හිරිහැරවලට අප ඉඩ නොදෙන්නෙමු.

### විවිධත්වය සහ සමාන ප්‍රවේශයක් ලබා දීම

සියලුම සේවකයින්ට සමාන ගෞරවයකින් සැලකීම් ලැබීමට අයිතියක් ඇත. ජාතිය, ස්ත්‍රී පුරුෂභාවය, වර්ණය, ජාතික හෝ සමාජ සම්භවය, ජනවාර්ගිකත්වය, ආගම, වයස, ආබාධිතභාවය, ලිංගික දිශානතිය, ලිංගික අනන්‍යතාවය හෝ ප්‍රකාශනය, දේශපාලන මතය හෝ අදාල නීතිය මගින් ආරක්ෂා කළ වෙනත් ඕනෑම තත්වයක් පදනම් වූ වෙනස්කම් හෝ හිරිහැර කිරීම්වලින් තොර සේවාස්ථාන පවත්වා ගැනීමට, විවිධත්වයක් ඇතිකිරීම ඉහළ නැංවීමට අපි කටයුතු කරන්නෙමු.

### සංගමයේ නිදහස

පළිගැනීම්, බිය ගැන්වීම්, ප්‍රචණ්ඩත්වය හෝ හිරිහැරවලට බිය නොවී කම්කරු සංගමයකට බැඳීමට හෝ පිහිටුවීමට කම්කරුවන්ට අයිතියක් ඇත. දේශීය නීතිය අනවශ් ය ලෙස සංගමයේ නිදහස සීමා කරන විට, අපි සාමූහික සේවක සංවාදය සහ කළමනාකරණය සමඟ සම්බන්ධ වීම සඳහා විකල්ප වේදිකාවලට සහාය දෙමු.

### බලහත්කාරයෙන් වැඩ ගැනීමෙන් නිදහස

බන්ධනාගාර ශ්‍රමය, ගිවිසුම්ගත ශ්‍රමය, ඇපකර ශ්‍රමය, හමුදා ශ්‍රමය, වහල් ශ්‍රමය හා ඕනෑම ආකාරයක මිනිස් වෙළඳාම ඇතුළු සියලු ආකාරයේ බලහත්කාර ශ්‍රම භාවිතය අපි තහනම් කරන්නෙමු. සේවා නියමයන් සහ කොන්දේසි සෑම සේවකයෙකුටම තේරෙන භාෂාවකින් සත්‍යවාදී සහ පැහැදිලි ආකාරයකින් නිරූපණය කළ යුතුය. කිසිවකුට කිසිවිටෙක බලකිරීම හෝ රැවටීම, ගාස්තුවක් ගෙවීමට අවශ්‍ය කිරීම හෝ රැකියා සුරක්ෂිත කිරීම සඳහා තම පුද්ගලික ලියකියවිලි භාර දීමට සිදු නොවිය යුතුය.

### ළමා ශ්‍රමයෙන් නිදහස

අපි වයස අවුරුදු 15 ට අඩු ළමයින්, නැතහොත් නීත්‍යානුකූලව වැඩ කරන වයස හෝ අනිවාර්ය පාසල් වයස යටතේ, ඉන් ඉහළ නම් එම වයසේ ළමුන් බඳවා ගැනීම තහනම් කරමු. ඕනෑම වෙනසක් නීත්‍යානුකූල විය යුතු අතර ILO 138 හි 7 පනත යටතේ අවසර ලත් "සැහැල්ලු වැඩ" අර්ථ දැක්වීම සමඟ ගැලපිය යුතුය. ILO අනතුරුදායක යැයි සලකන රැකියාවක නිරත වීමට වයස අවුරුදු 18 ට අඩු ඕනෑම අයෙකු බඳවා ගැනීම අපි තහනම් කරමු. අපි ඔවුන් බඳවා ගන්නා අවස්ථාවේ සියලුම සේවකයින්ගේ වයස තහවුරු කරමු.

### වැටුප් සහ සේවා පැය

ජාතික නීතිය, කර්මාන්ත ප්‍රමිතීන් සහ ප්‍රාදේශීය ශ්‍රම වෙළඳපොලවල් සමග පෙලගැසී, සහ අදාළ ඕනෑම සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් වල කොන්දේසිවලට අනුකූලව කම්කරුවන්ට සාධාරණ ලෙස වැටුප් ගෙවිය යුතුය. සියලුම අතිකාල සුදුසු වාරිකයකට ගෙවනු ලබන අතර, සියලුම සේවකයින්ට සාධාරණ විවේක කාලයන් සහ නිවාඩු දින සඳහා හිමිකම් ඇත.

### ඉඩම් හිමිකම්

අපි ප්‍රජාවන්ගේ නෛතික සහ සිරිත මත පවතින දේපල හිමිකමට ගරු කරමු. ඉඩම් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම්වලට ඉඩ ලබා නොදෙන අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී නිදහස්, පූර්ව සහ දැනුවත් කැමැත්ත යන මූලධර්මයට අනුකූලව දේශීය ප්‍රජාවන් ප්‍රමාණවත් ලෙස දැනුවත් කර නිසි උපදෙස් මත එය ලබා ගත යුතුය.

### ජලය සහ පාරිසරික භාරකාරත්වය

අපි ප්‍රාදේශීය ජල අවදානම් තක්සේරු කිරීම මගින් අවදානම අවම කරන ජලය සඳහා මානව හිමිකම් පදනම් කරගත් ප්‍රවේශයක් ගනිමු; ජල ආතති විසඳුම් සංවර්ධනය කිරීම සඳහා රජයන්, ප්‍රජාවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ උපදේශනය සහ හවුල් වීම; සහ, අවශ්‍ය විට, මූලාශ්‍ර-ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම. අපගේ පාරිසරික බලපෑම අවම කිරීමට සහ විද්‍යාව පදනම් කරගත් ඉලක්ක හරහා අපගේ කාබන් පියසටහන අඩු කිරීමට අපි ක්‍රියාකාරීව ක්‍රියා කරමු. කම්පන සහ දිගු කාලීන දේශගුණික ආතතීන්ට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනඟන ප්‍රවේශයන් ඇතුළුව, ස්වභාවික වාසස්ථාන, ආරක්ෂිත ප්‍රදේශ සහ ජෛව විවිධත්වය ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට අපි උදව් කරන්නෙමු.

### පෞද්ගලිකත්වය

අපි පුද්ගලයන්ගේ පෞද්ගලිකත්ව අයිතිවාසිකම්වලට ගරු කරන අතර අපගේ පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිවලට අනුකූලව, අපට භාර දී ඇති පුද්ගලික සහ රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීමට සාධාරණ පියවරයන් ක්‍රියාත්මක කරන්නෙමු. අපි පුද්ගලික තොරතුරු කල්පනාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රදර්ශනය කරන ආකාරය අඛණ්ඩව ශක්තිමත් කිරීමට අපට උපකාර වන, ප්‍රශ්න හෝ නිරීක්ෂණ බෙදා ගැනීමට කැපවූ මාර්ගයන් සපයන්නෙමු.

### පාරිභෝගිකයින්ගේ යහපැවැත්ම

මානව හිමිකම් පිළිබඳ අපගේ කැපවීම අපගේ ගණුදෙනුකරුවන් හා පාරිභෝගිකයින් දක්වා දිවයයි. සෞඛ්‍ය සම්පන්න ජීවන රටාව සමඟ දැනුවත්වූ තෝරා ගැනීම් ගලපා ගැනීමට පාරිභෝගිකයන්ට හැකිවනු පිණිස පාරදෘශ්‍ය පෝෂණ තොරතුරු සහ පානීය ද්‍රව් ය පරාසයක් ලබා දීමට හා වගකීම් සහගත අලෙවිකිරීමක් සඳහා අපි බැඳී සිටින්නෙමු.

## ක්‍රියාත්මක කිරීමේ මූලධර්ම

### පාලනය සහ ක්‍රියාත්මක කිරීම

සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා වාර්තා කරන ජ්‍යේෂ්ඨ උප සභාපති, ගෝලීය මානව හිමිකම්, කම්කරු සහ සේවක සබඳතා විසින් මෙම ප් රතිපත්තිය අධීක්ෂණය කරනු ලැබේ. ගෝලීය මානව හිමිකම් දෙපාර්තමේන්තුව (GHR) සමාගමේ මානව හිමිකම් ක්‍රමෝපාය සහ වැඩසටහන් සඳහා නායකත්වය දෙන අතර, අපගේ ගෝලීය වටිනාකම් දාමය හරහා අපගේ කැපී පෙනෙන අවදානම්, කාර්ය සාධනය සහ විකාශනය වන අපේක්ෂාවන් පිළිබඳව මණ්ඩලයට නිරන්තර යාවත්කාලීන කිරීම් සපයයි.

GHR ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවර්ධනය කිරීම, මානව හිමිකම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම සහ මානව හිමිකම් පුහුණුව පැවැත්වීම සඳහා ජාලගත සංවිධානයක් ලෙස සමාගම පුරා ක්‍රියා කරයි. අපගේ බීම බෝතල් කරන සමාගම සහ සැපයුම්කරුවන් පිළිබඳ අපගේ මානව හිමිකම් අපේක්ෂාවන් ප්‍රකාශ කිරීම, වාර්ෂික ප් රමිතික හරහා වැඩසටහන් ඵලදායිතාව අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම යන අපගේ සැපයුම්කරු මාර්ගෝපදේශක මූලධර්ම ක්‍රියාත්මක කිරීම GHR විසින් අධීක්ෂණය කරයි.

### සැපයුම්කරුවන්ගේ හා බීම බෝතල් කරන සමාගමේ අපේක්ෂාවන්

සැපයුම්කරුවන් සඳහා වන අපගේ අවශ්‍යතා ගිවිසුම්ගත කර ක්‍රියාත්මක කරනු ලබන්නේ අපගේ **සැපයුම්කරුවන්ගේ මාර්ගෝපදේශක මූලධර්ම** සහ **තිරසාර කෘෂිකර්මාන්තය සඳහා වූ මූලධර්ම වලින් ය**. මෙම සැපයුම් කරුවන් සහ බීම බෝතල් කරන සමාගම්වල මානව හිමිකම් අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම සඳහා අපි දැඩි වැඩපිළිවෙලක් පවත්වාගෙන යන්නෙමු. මානව හිමිකම් අභියෝග ආමන්ත්‍රණය කිරීමට සහ හානිවලට පිළියම් යෙදීමට ඔවුන්ට උපකාර කිරීමට අපි බීම බෝතල් කරන සමාගම් සහ සැපයුම්කරුවන් සමඟ වැඩ කරන්නෙමු, නමුත් සුදුසු විට මානව හිමිකම් හේතුවෙන් සැපයුම් සම්බන්ධතා අපි අවසන් කරන්නෙමු.

### පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

අපි ප්‍රජාවන්, කම්කරුවන්, මානව හිමිකම් ආරක්ෂකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ ඔවුන්ගේ ඉදිරිදර්ශන අපගේ තීරණ දැනුම් දෙන බව සහතික කිරීම සඳහා නිතිපතා සම්බන්ධ වන අතර, ප්‍රචණ්ඩත්වය, බිය ගැන්වීම් හෝ වෙනත් පළිගැනීමේ ක් රියාවන්ගෙන් අප නිරත වන මානව හිමිකම් ආරක්ෂකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් ආරක්ෂා කිරීමට අපි සියලු සාධාරණ පියවර ගන්නෙමු. එම සබඳතා අපගේ සාර්ථකත්වයට ඉතා වැදගත් බවත් ලෝකය සමඟ අපගේ බැඳීමටත් ඉතා වැදගත් ලෙසත් අප සලකන්නෙමු.

### දුක්ගැනවිලි සහ පිළියම

ව්‍යාපාර හා මානව අයිතීන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ උපදෙස්වලට අනුකූලව, අපගේ මෙහෙයුම් හා සම්බන්ධ අහිතකර මානව හිමිකම් බලපෑමකට ලක්වන ඕනෑම කෙනෙකුට සුදුසු පිළියම් සඳහා ප්‍රවේශය සහතික කිරීමට අපි කටයුතු කරන්නෙමු. අපගේ **KO Ethics Line** ඕනෑම කෙනෙකුට-සේවකයෙකු, අපගේ සැපයුම් දාමයේ සේවකයෙකු, බලපෑමට ලක් වූ ප්‍රජාවක සාමාජිකයෙකු හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට-මානව හිමිකම් හෝ ආචාර ධර්ම ගැටළු වාර්තා කිරීමට ඉඩ සපයයි. එය අන්තර්ජාලය හරහා හා දුරකථනය හරහා භාෂා 23 කින් ලබාගත හැක. චෝදනා හා දුක්ගැනවිලි නිර්ණාමිකව ලබාදිය හැකිය. ඕනෑම උල්ලංඝනයකට ප්‍රතිචාර ලෙස අප විමර්ශනයක් සිදුකර අවශ්‍ය නිවැරදිකිරීමේ පියවර ලබාගන්නෙමු. පැමිණිලිකරුවන්ගේ නෛතික අයිතිවාසිකම් අත්හැරීම සම්බන්ධයෙන් අපි කිසිවිටෙක අපගේ දුක්ගැනවිලි නාලිකා භාවිතයට කොන්දේසි නොකරමු.

ඕනෑම අවස්ථාවක මෙම ප්‍රතිපත්තිය සංශෝධනය කිරීමේ අයිතිය සමාගම සතු ය. මෙම ප්‍රතිපත්තියට අනුකූල වීම, Coca Cola සමාගමෙහි අඛණ්ඩව රැකියාවේ නිරත වීම සඳහා වන සහතිකයක් නොවේ.